www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයේ මහා විනාශක අවි පිලිබඳ වාර්තාව, ඉරාක යුද්ධය යුක්ති සහගත කිරීමට බුෂ් ද, ඩිමොක්‍රැටික් පක්ෂය ද යන දෙගොල්ල ම මුසා ඇද බෑ බව ඔප්පු කරයි

**Iraq WMD report proves Bush, Democrats lied to justifyIraq war**

**කර්තෘ මන්ඩලය විසිනි**
**2004 ඔක්තෝබර් 8**

ඉරාක සමීක්ෂන කන්ඩායම (ඉසක - ඉරාක් සර්වේ ගෲප්) විසින් ඔක්තෝබර් 6 දා නිකුත් කරුනු වාර්තා වනාහී එක් ජනාධිපතියෙකු හෝ එක් පාලනාධිකාරයක් පිලිබඳ චෝදනා පත්‍රයක් පමනක් නො වේ; එය වනාහී එක්සත් ජනපදයේ සමස්ත පාලක ප්‍රභූවට ම එල්ල කරුනු චෝදනාභියෝගයකි. මෙම චෝදනාව තහවුරු කරන්නේ ඉරාකයේ මහා විනාශක අවි තිබුනේ යයි එක්සත් ජනපද පාලනාධිකාරයන් තුනක් විසින් ඉදිරිපත් කරනු ලැබූ ද ඇමරිකානු මාධ්‍යයන් විසින් අවිවේචනාත්මක ව ගිරා වතින් උසුරුවනු ලැබුවා වූ ද තිත්ත බොරු බව ය.

තමන් මහා විනාශක අවි ගොඩගසාගෙන සිටියේ යයි කරන ලද චෝදනා පිලිබඳ ව ඉරාක ආන්ඩුව දිගින් දිගට ම කියා තිබෙන්නේ ඇත්ත ය. ඉරාකය මහා විනාශක අවි තොග ගොඩගසා ගෙන තිබුනේ ය යන්නට හෝ න්‍යෂ්ටික අවි තැනීමේ වැඩකටයුතු කර ගෙන යාම හෝ පිලිබඳ ව මොන ම සාක්ෂියක් වත් නැතැ යි එක්සත් ජාතීන්ගේ අවි පරීක්ෂකයන් වූ මොහම්මඩ් එල්බරදෙයි සහ හැන්ස් බ්ලික්ස් කියා සිටියේ ද ඇත්ත ය. හිටපු අවි පරීක්ෂක ස්කොට් රිටර් ඉරාකය තම මහා විනාශක අවි ධාරිතාව ගලවා බිඳ දැමුවේ බොහෝ කලකට පෙර යයි කියා සිටි විට ඔහු ද නිවැරදි විය.

ඇමරිකානු ආන්ඩුවේ පච විනිවිද දැකගත්තා වූ ලොව පුරා ජනතාව ද, රටවල් දුසිම් ගනනක පෙලපාලි දැක්වූනේ ද නිවැරදි වූවෝ ම ය. ගොබෙල්ස්ගේ පොතෙන් පිටුවක් උපුටා ගැනීම ගැන ද "මහ බොරුවේ" උපක්‍රමය යොදා ගෙන අපරාධකාරී කුමන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම ගැන ද වැරදිකරුවන් ලෙස තීන්දු වී ඇත්තේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ය.

අලුතින් ම එලිදැක ඇති ඩුඑල්ෆර් වාර්තාව පෙන්නුම් කර ඇත්තේ ඉරාකයේ රසායනික සහ ජීවවිද්‍යාත්මක ආයුධ 1991 දී ම එරට විසින් විනාශ කර තිබෙන බවත් යලිත් ඒවා නිර්මානය නො කරන ලදස බවත් ය. ඉරාකයට න්‍යෂ්ටික අවි වැඩ පිලිවෙලක් තිබුනේ නැත; ඉරාකය න්‍යෂ්ටික අවි තැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හෝ නිෂ්පාදන තාක්ෂනය ගොඩනගා ගැනීමට කිසිම දෙයක් කරමින් සිටියේ ද නැත. මෙයට ප්‍රතිකූලව, එක්සත් ජනපදය විසින් උර දී ක්‍රියාත්මක කෙරුනු ආර්ථික සම්බාධනය යටතේ - එක් මිලියනයක් ඉරාක ජාතිකයින් ආහාර, බෙහෙත් ද්‍රව්‍ය නැතිව මියගිය අතර එයින් භාගයක් ම දරුවෝ ය - මොනයම්මැ හෝ යුද්ධමය සංස්ථාපිතයක් පවත්වා ගැනීමේ හැකියාව ඉරාකයට දිගින් දිගට ම හීන වී ගොස් තිබුනි.

ඉරාක සමීක්ෂන කන්ඩායම පරීක්ෂකයන් 1,200කට වැඩි සංඛ්‍යාවක් බලමුලුගන්වා ගත්තේ ය; 2002 එක්සත් ජනපද ආක්‍රමනයෙන් පසු මාස 15ක් තිස්සේ ඉරාකය පීරා බැලුවේ ය; එහෙත් ආයුධ තොග, ආයුධ කම්හල්, රහස් පර්යේෂනාගාර හෝ බුෂ් පාලනය කියා පෑ වෙනත් පහසුකම් කිසිවක් එහි තිබුනේ නැත. ඉසක විසින් එක්රැස් කරගනු ලැබූ සාක්කි යුද්ධය ආරම්භ කිරීමට පෙර දිනවල ධවල මන්දිරයේ, පෙන්ටගනයේ, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහ සීඅයිඒ සංවිධානයේ ඉතාම පලල් ව ප්‍රසිද්ධ කරනු ලැබුනු සියලුම ප්‍රකාශයන් බොරු කර ඇත.

* ක්‍රියාත්මක ඉරාක න්‍යෂ්ටික වැඩපිලිවෙලක් තිබුනේ නැත. ඩුඑල්ෆර්ට අනුව, ඉසක පරීක්ෂන කමිටුවට, ‘‘ඉරාකය 1991න් මොබ හංගුර ද්‍රව්‍ය (න්‍යෂ්ටික පිපිරීම් සඳහා අත්‍යවශ්‍ය) හෝ න්‍යෂ්ටික අවි පර්යේෂන ආරම්භ කල බවට සාක්ෂි සොයා ගත නොහැකි විය.’’

* ඉරාකය ඇලුමිනියම් ටියුබ් ආනයනය කර තිබුනේ ඉරාක නිලධාරීන් කී පරිදි ම කුඩා පරිමාන යුද රොකට් නිෂ්පාදනය සඳහා මිස සක්‍රීය යුරේනියම් සඳහා අවශ්‍ය වූ කේන්ද්‍රාපසාරකයන් නිර්මානය සඳහා නො වේ.

* 1991 න් පසු ඉරාකය පිටරටින් යුරේනියම් මිල දී ගෙන නැත; අප්‍රිකානු ජාවාරම්කරුවෙක් විසින් එරටට යුරේනියම් විකුනන්නට උත්සාහ කල කල්හි එක්සත් ජාතීන්ගේ තහංචි පෙන්වා දෙමින් ද එය ප්‍රතික්ෂේප කැරිනි.

* ජංගම ජීවවිද්‍යාත්මක අවි පර්යේෂනාගාර යයි එක්සත් ජනපද නිලධාරීන් කියා පෑ ට්‍රේලර් රථ ද ඇත්ත වශයෙන් පාවිච්චි කර තිබෙන්නේ කාලගුන මාපක බැලුන් සඳහා හයිඩ්‍රජන් වායුව නිර්මානය කිරීමට ය.

* ආක්‍රමනික එක්සත් ජනපද හමුදා ඉන් ඔබ පැන ආවොත් ඉරාක හමුදා මහා විනාශක රසායනික අවිවලින් පහරදිය යුතු සීමාව යයි නියමිත

බැග්ඩෑඩයෙන් දකුනේ ''රතු ඉරක්'' ද තිබුනේ නැත.

එක්සත් ජනපද ආයුධ පරීක්ෂකයන්ගේ නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ඉරාකය තුල අවුරුදු 6ක් ගත කර තිබෙන ඩුඑල්ෆර් මෙම ඉසකයේ ප්‍රධාන තනතුරට තෝරා පත් කර ගනු ලැබුවේ සීඅයිඒ අධ්‍යක්ෂක ජෝර්ජ් ටෙනට් විසිනි. බුෂ්ගේ ධවල මන්දිරයේ කිට්ටුම සගයෙකු වූ මොහු ඉසක ප්‍රධාන තනතුරට පත්වීමට පෙර, ඉරාකය ද සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාරයන් ද අතර සම්බන්ධතාවක් පැවැති බව තමාට ඒත්තු ගොස් තිබුනු බව ප්‍රකාශ කර තිබුනේ ය. එහෙත් පසු ගිය බදාදා සෙනේට් මන්ත්‍රී මන්ඩලයේ සන්නද්ධ සේවා කොමිසම ඉදිරියට ඔහු එන විට ඔහු එහි පරීක්ෂක මන්ඩලයට කියා සිටියේ, ඉරාකය පිලිබඳ ව, "අපට මුලුමනින් ම වැරදී තිබුනි" යයි කියා ය.

හුසේන්ගේ ඉරාකය එක්සත් ජනපද ජාතික ආරක්ෂාවට තර්ජනයක් නියෝජනය කලේ ය යන ඔවුන්ගේ කියාපෑම් යුක්ති සහගත කිරීමට මොකක් හෝ සොයා ගැනීමට බුෂ් පාලනාධිකාරයේ නිලධාරීන් ඉසක වාර්තාව පොලා-පීරා තිබේ. උනට සොයා දැක්විය හැකිව තිබෙන්නේ එක්සත් ජනපද නියෝජ්‍ය ආරක්ෂක ලේකම් රිචර්ඩ් ආර්මිටේජ් කී පරිදි ඉරාකය භයානක අවි ආයුධ අත්පත් කර ගැනීමට "ශක්‍යතාව ද අධ්‍යාසය ද" ඉතුරු කරගෙන සිටියේ ය යනුවෙන් සඳහන් කරන ලද්දක් පමනි. මෙය නම් පිදුරු ගස් අල්ලා ගැනීමක් ම වේ.

එක්සත් ජනපද තහංචි ඉවත් කරනු ලැබුවේ නම්, හුසේන් රසායනික සහ ජීව විද්‍යාත්මක සහ න්‍යෂ්ටික අවි වර්ධනය කර ගැනීමට අපේක්ෂා කලේ යයි ඩුඑල්ෆර් සමපේක්ෂනය කල අතර, ඉසකයට එවන් සිතලු ස්ඵුට කිරීම සඳහා සාක්කි ලෙස සැබෑ සැලසුම් හෝ වෙනත් කරුනු සොයා ගැනීමට නො හැකි වී යයි ඔහු පිලිගෙන තිබේ.

## ආක්‍රමනකාරී යුද්ධය සූදානම් කැරුනු අයුරු

සමහර විට ඉසකයේ වැදගත් ම සොයා ගැනීම නම් 1991 පර්සියානු ගල්ෆ් යුද්ධයෙන් පසුව ඉරාකයේ අසම්ප්‍රදායික අවි වැඩ පිලිවෙල මුලුමනින් ම පාහේ නවතා දමන ලද බව ය.

හුසේන් තන්ත්‍රය මුලින් ම රසායනික අවි වර්ධනය කලේ 1980-88 ඉරාන-ඉරාක යුද්ධයේ දී යොදා ගැනීම සඳහා ය. එක්සත් ජනපදයේ උසිගැන්වීම මත ගල්ෆ් ප්‍රදේශය තුල ප්‍රධාන ඇමරිකානු සහකරුව සිටි ඉරාන ෂා රජුගේ පාලනය පෙරලා දමා පිහිටුවන ලද ඉස්ලාමීය මූලධර්මවාදී පාලන තන්ත්‍රයට එරෙහිව හුසේන් එම යුද්ධය ආරම්භ කලේ ය. හුසේන්ගේ හමුදා ඉරාන භටයන්ට එරෙහිව රසායනික අවි පලල් අන්දමින් පාවිච්චි කල බව තහවුරු කරනු ලැබීමෙන් පසුව ද එක්සත් ජනපද නිලධාරියෝ ඉරාකයට යුද්ධමය, බුද්ධි අංශමය, සහ රාජ්‍ය තාන්ත්‍රික ආධාර සම්පාදනය කිරීම නො නැවැත් වූවා පමනක් නො ව උත්සන්න ද කලහ. දැන් රාජ්‍ය ලේකම් ව ඉන්නා ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් 1983-84 කාලයේ එක්සත් ජනපද විශේෂ තානාපති නියෝජිතයෙකු ලෙස බැග්ඩෑඩ් නගරයට දෙවරක් ම ගමන් කරමින් රීගන් පාලනයේ සහාය හුසේන්ට දිගින් දිගට ම ලබා දෙන බවට පොරොන්දු විය.

1991 දී එක්සත් ජනපද හමුදා මුලුමනින් ම පාහේ අනපේක්ෂිත වූ බලයෙන් හමුදාවට බඳවා ගනු ලැබූ (අනි'ච්ඡිත) සොල්දාදුවන් දසදහස් ගනනින් මරා දමමින් ඉරාක හමුදාවන් කුවේටයෙන් පලවා හැරිය පසුව ද හුසේන් එක්සත් ජාතීන්ගේ දැඩි ආයුධ පරිපාලනයක් පිලිගති; එක්සත් ජනපද පාලනය ඉක්මනින් ම ඔහුගේ රසායනික අවි පහසුකම් බිඳ-ගලවා දැමී ය; පර්යේෂන වැඩපිලිවෙල ද රසායනික අවි ද භංග කර දැමී ය. ඉසක වාර්තාව පෙන්වා දෙන පරිදි අවසාන පර්යේෂන පහසුව විනාශ කරන ලද්දේ 1990 දී ය.

එහෙත් 1990 ගනන් පුරා ම එක්සත් ජනපද නිලධාරීහු දිගින් දිගට ම ඉරාකය ආර්ථික ව ගෙල මිරිකා දැමීම සඳහා හේතුව ලෙස යලි යලිත් ඒ රට සතුව මහා විනාශක අවි ඇතැයි ද එක්සත් ජාතීන්ගේ අවි පරීක්ෂකයන්ට කීකරු නොවන්නේ යයි ද කියා පෑවාහ. මෙම දිග්ගැසුනු ප්‍රෝඩාව ආරම්භ කලේ ප්‍රථම බුෂ් පාලනාධිකාරය විසිනි. ක්ලින්ටන් පාලනාධිකාරය මෙය (1993-2001) දක්වා අට අවුරුද්දක් පවත්වා ගෙන ගියේ ය. දෙවන බුෂ් පාලනාධිකාරය ඉරාකය ආක්‍රමනය කර අල්ලා ගැනීම මගින් වැඩය තීන්දුවට ම ඉටු කර දැමුවේ ය.

මහා විනාශක අවි ප්‍රෝඩාව 1991 දී ඇරඹීම අහම්බයක් නො වේ; එය වනාහී සෝවියට් සංගමය බිඳ වැටුනු වර්ෂය ය. 1991 පෙබරවාරියේ දී අවසන් වූ ප්‍රථම ගල්ෆ් යුද්ධයෙන් පවා, තමන් ඉරාකය ආක්‍රමනය කලහොත් ඉරාකයේ බාත්වාදී පාලනය සමග දිගුකාලීන සබඳකම් පැවති බලගතු මිලිටරි ප්‍රතිමල්ලයෙකු වූ සෝවියට් සංගමය සමග යුද්ධමය වසයෙන් මුහුනට මුහුන ලා ගැටීමේ තත්වයක් නිර්මානය විය හැකි ව තිබුනු හෙයින් ප්‍රථම බුෂ් පාලනාධිකාරය එසේ කිරීමෙන් වැලැකී සිටියේ ය.

1991 දී දෙසැම්බරයේ දී සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට සෝවියට් මිලිටරි ප්‍රතිප්‍රහාරයක් ගැන බියවීමට හේතුවක් තිබුනේ නැත; ඉරාකයට සෝවියට් මිලිටරි ආධාර ලැබෙතැයි බියක් ඉතුරුව තිබුනේ ද නැත. ඉරාකයේ තෙල් සම්පත් අල්ලාගෙන මැදපෙරදිග මෙම තීරනාත්මක ප්‍රදේශය තුල ඇමරිකානු මිලිටරි සහ දේශපාලන ආධිපත්‍යය සඳහා පයරුකුලක් ලබාගත යුතු යයි සමමතියක් ඇමරිකානු පාලක ප්‍රභුව තුල ඉක්මනින් ම වැඩී තහවුරු විය.

මේ වැඩය කර ගත යුතු හොඳම විධිය කුමක් ද යන්න ගැන විවිධ මතිමතාන්තර පැවැතුනි. එක්සත් ජනපදය මැදපෙරදිග භූමි යුද්ධයකට හා ඉරාකය තුල හමුදා පිහිටුවා කරන පාලනයක් ගැන පරෙස්සම් විය; පැකුලුනි. යුද පරාජය ද, සම්බාධක ද, එක්සත් ජනපදයේ විවෘත හා ආවෘත ප්‍රහාර ද විසින් සදාම් හුසේන් පාලනය බිඳ වැටෙනු ඇතැ යි ප්‍රථම බුෂ් පාලනය විශ්වාස කරගෙන සිටියේ ය. එක්සත් ජනපදයට නැමෙන පාලනයක් ඉරාකය තුල අටවා ගත හැකිවනු ඇතැයි එය අපේක්ෂා කලේ ය. ඒ අතර තුරේ, එක්සත් ජනපදය කුර්ඩ් හා ෂියා කැරලිවලට එරෙහිව හුසේන්ට සහය දැක්විය. මන්ද යත් ඒවා

ඉරානය සමග මිත්‍ර වූ ඉරාකයක් බිහි කරනු ඇතැ යි ප්‍රථම බුෂ් පාලනාධිකාරයට බියක් තිබුනු නිසා ය.

සදාම්ට එරෙහි අපේක්ෂිත හමුදා බලකොල්ලය ඉටු නො වූ කල්හි, ප්‍රථම යුද්ධයෙන් ලබාගත් දේ මදි යයි අසන්තෘප්තියට පත් කන්ඩායම් එක්සත් ජනපදයේ නව මිලිටරි ආක්‍රමනයක් ඉදිරියට තල්ලු කිරීමට තම වැඩකටයුතු උත්සන්න කලහ.

1992 දී එවකට ආරක්ෂක ලේකම් වූ ඩික් චෙනීගේ ඇනැවුම පරිදි පෝල් වොල්ෆොවිට්ස් මැදපෙරදිග දිගුකාලීන එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනයක් සඳහා ප්‍රථම පිඹුරු පත් ඇන්දේ ය.

ලෝක පරිමාන ඇමරිකානු ආධිපත්‍යයෝ ද ඇමරිකාවේ විදේශ පිලිවෙතට බාධාවක් යයි පෙනී යන ඕනෑ ම "පාලන තන්ත්‍ර මාරු කර දැමීමේ ද" පිලිවෙතක් ඉල්ලා සිටි නව ඇමරිකානු ශතකයක් සඳහා ව්‍යාපෘතිය ද යන නම් ලත් කන්ඩායම වැනි නියො-කොන්සර්වෙටිව් (නව-තත්වාරක්ෂක) කන්ඩායම් විසින් අනුදක්නා ලද වැඩ පිලිවෙල පිලිබඳ ප්‍රථම කෙටුම්පත ලෙස මෙය ඉදිරිපත් විය.

ප්‍රථම බුෂ් පාලනාධිකාරයේ ක්ලින්ටන් පිලිවෙත තවදුරටත් උත්සන්න කෙරුනු වර්තනයක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කලේ ය. ඔහුගේ පාලනාධිකාරය ඉරාකයට එරෙහි නිරන්තර කෲස් මිසයිල ප්‍රහාර එල්ල කලේ ය. කෙටි එහෙත් ලේවැකි බෝම්බ ප්‍රහාර දෙකක් එල්ල කලේ ය; එක්සත් ජාතීන්ගේ අවි පරීක්ෂකයන් ලවා ප්‍රකෝපකාරී ක්‍රියා සංවිධානය කලේ ය. තහංචි ද, ඉරාකය තුල ඒ රටේ පාලනයට 'ගුවන් යානා පැදවීමේ තහනම් ප්‍රදේශ" පවත්වාගෙන ගියේ ය. සදාම් හුසේන් ඝාතනය කිරීම සඳහා සීඅයිඒ රහස් ඒජන්තයන් එක්සත් ජාතීන්ගේ අවි පරීක්ෂක කන්ඩායම් තුලට රිංගවිය. ක්ලින්ටන් අසාර්ථක හමුදා බලකොල්ලයන් ගනනාවක් ද, විවෘත සීඅයිඒ ත්‍රස්ත ක්‍රියා ද, සංවිධානය කලේ ය. මීට දැන් එක්සත් ජනපදය විසින් අන්තර්වාර අගමැති ලෙස පත් කර සිටින අයාද් අල්ලාවි විසින් 1990 ගනන් මැද දී ක්‍රියාත්මක කල අසාර්ථක බලකොල්ලය ද ඇතුලත් ය. ඉරාකය විමුක්ත කර ගැනීමේ (ඉරාක ලිබරේෂන් ඇක්ට්) පනතට අත්සන් තබා "පාලන තන්ත්‍ර මාරුව" එක්සත් ජනපදයේ නිල පිලිවෙත බවට පත් කර ගනු ලැබින.

එක්සත් ජනපදයේ ප්‍රතිමල්ලවයන් වූ ප්‍රන්සය, රුසියාව ඉරාකය තුල තමන්ගේ දේශපාලන හා තෙල් අවශ්‍යතා සඳහා වඩ වඩාත් ආක්‍රමනශීලි ව ක්‍රියාත්මක වන්නට පටන් ගත් කල්හි තහංචි ලිහී යන්නට පටන් ගත් විට එක්සත් ජනපද පාලක ප්‍රභූව වඩ වඩාත් දැඩි ලෙස හොඳ ම විකල්පය නම් යුද්ධය ය යන නිගමනයට එලඹෙන්නට පටන් ගත්තේ ය. 2001 ජනවාරි මාසයේ දී පිහිටුවන ලද වත්මන් බුෂ් පාලනාධිකාරය ද සමග ඉරාකය ආක්‍රමනයේ හා අත්පත් කර ගැනීමේ අධිභාෂකයෝ බලයට පත්වූහ. 9/11 ප්‍රහාරය - අබිරහස් සහ තවමත් එලිදරව් නො කැරුනු කොන්දේසි යටතේ - සිදු වී - මෙම ආක්‍රමනශීලීන් විසින් සැලසුම් ක්‍රියාත්මක කිරීමට ව්‍යාජයක් ලෙස කෑදර ව ග්‍රහනය කර ගනු ලැබුනු විට ද ආක්‍රමන සැලසුම් බොහෝ දුර මෝරා ගොස් තිබුනි.

මුල පටන් ම, ඇමරිකා එක්සත් ජනපදය විසින් මංකොල්ලකාරී අරමුනු සඳහා මහා විනාශක අවි ප්‍රශ්නය ව්‍යාජයක් ලෙස පාවිච්චි කර තිබුනි. ප්‍රකෝපකාරී ක්‍රියා ද මිලිටරි ප්‍රහාරයන් ද යුක්ති සහගත කිරීම සඳහා ද රට විනාශ කර එක්සත් ජනපද ආධිපත්‍යය යටතට ගැනීම සඳහා ද මෙය ප්‍රයෝජනවත් දඬමීමකු ලෙස යොදාගන්නා ලදි. එය මහජනතාව භීතියට පත් කොට, ඉරාකයට එරෙහි 'පූර්ව-භංග' යුද්ධයකට ඔවුන් අනුගත කරවා ගැනීම සඳහා ද එය ප්‍රයෝජනවත් විය.

එහෙත් මහා විනාශක අවි පිලිබඳ මුසා ව්‍යායාමය යුද්ධය සඳහා පලල් මහාජන සහායක් ලබාගැනීමට කවර කලෙකවත් හැකි වූයේ නැත. ආක්‍රමනය සිදු කරන ලද්දේ ම එක්සත් ජනපදය තුල ද ජාත්‍යන්තරව ම ද මහා ජන විරෝධයට මුහුන දී ගෙන ය. ඉරාකය - ක්ෂනික, ක්‍රමික හෝ භාරක - තර්ජනයක් යයි පිලි නො ගත්තාහ.

## ඉරාක යුද්ධය; අපරාධයකි, 'වැරදීමක්' නො වේ.

මෙම ඉතිහාසය අර්ථභාරී කරන්නේ කුමක් ද? ඉන් අදහස් වන්නේ ඉරාකය ආක්‍රමනය කිරීම ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් විසින් කැරුනු කිසියම් අපේරනයක් නො වන බව ය. එය පැනනැංගේ දශකයකට වැඩි කාලයක් තිස්සේ, රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් පාක්ෂික පාලනාධිකාර තුනක් යටතේ ගෙන යන ලද පිලිවෙතක් තුලිනි. එවන් තීන්දුවක් ඩිමොක්‍රැටික් පක්ෂ ජනාධිපති අපේක්ෂක ජෝන් කෙරී කියන පරිදි "වැරැද්දක්" නොවේ. එය වනාහි මහා මූර්ග අපරාධයකි; කල්යල් බලන ලද පිලිවෙතක් සාපරාධී ලෙස ක්‍රියාත්මක කිරීමකි. එම අපරාධයට එක්සත් ජනපදයේ පාලක ප්‍රභූව වගකිව යුතු බව තහවුරු කරමු.

ඉරාකයේ මහා විනාශක අවි නො තිබුනු අතර කෙසේ වෙතත් ඒවා එහි තිබුනේ යයි එක්සත් ජනපද නිලධාරීන් විශ්වාස කල බව ද ඒ අනුව ඔවුන් ක්‍රියා කල බව ද තහවුරු කරන්නට ඩුඑල්ෆර් වාර්තාව උත්සාහ කරයි.

*වොෂින්ටන් පෝස්ට්* පුවත් පත කර්තෘන් බඳු බුෂ් පරිපාලනයේ අන්තිම - ආරක්ෂක අගල සපයන්නෝ මෙම අදහස වැලඳ ගනිති. ඉසක වාර්තාව නිකුත් වූ පසු ඔව්හු තම කතුවැකියේ කීවේ, මහා වනසු අවි පිලිබඳව බුෂ්ට වැරදුනු නමුත්, ඔහුට ලැබුනු බුද්ධි අංශ තොරතුරු යුද්ධයට යාම හැර වෙනත් විකල්පයක් ඔහුට ඉතුරු නො කල බව ය.

මෙ ද තව පචයකි. ප්‍රශ්නය කවර විටෙකවත් මහා විනාශක අවි වූයේ නැත - එවන් දේ තිබුනේ ද නැත. ඉරාකය තර්ජනයක් යයි බුෂ් පරිපාලනයට සැබෑ බියක් තිබුනේ ද නැත. මෙයට ප්‍රතිකූලව සිදු වූයේ ඉරාකය ආක්‍රමනය සඳහා කුමන්ත්‍රනය කලෝ ඒ රට මූලික වසයෙන් ම ආරක්ෂාවක් නැති තත්වයකට පත්ව තිබුනේ ය යන කාරනාව ගනන් ගත්තෝ ය.

බුෂ් පරිපාලනය ඉරාකය සමග යුද්ධයකට යාම තෝරා ගත්තේ ඒ රට සුදුමැලි වනතෙක් ලේ ගලා, සම්බාධකවලින් විනාශයට පත්ව, බරපතල ප්‍රතිරෝධයක් දැක්විය හැකි යුද බලයකින් තොරව ඒ

තියා පහසුවෙන් නෙලා ගත හැකි නටුව පරවූ ගෙඩියක් බවට පත් ව තිබුනේ යයි දැන සිටි නිසා ය. මංකොල්ලයක් වූ එහි අරමුන වූයේ ඉරාකයේ යෝධ තෙල් නිධි අල්ලා ගැනීම ද ඇමරිකානු අධිරාජ්‍යවාදයට යුරෝපයේ ද ආසියාවේ ද තම ප්‍රතිමල්ලවයින්ට එරෙහි තීරනාත්මක මූලෝපායික වාසියක් අත්පත් කර දෙන මැදපෙරදිග ලක්ෂ්‍යයක මැද එක්සත් ජනපද හමුදාවන් පිහිටුවාලීමත් ය.

මෙය වනාහී වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම යුද්ධ අපරාධයකි. නුරෙම්බර්ග්හි (නාසි යුද්ධාපරාධකරුවන්ට එරෙහි දෙවන ලෝක යුද්ධයෙන් පසු පවත් වන ලද නඩු විභාගය) පූර්වාදර්ශය යටතේ ආක්‍රමනකාරී යුද්ධයක් සැලසුම් කර සූදානම් කිරීම මානව වර්ගයාට එරෙහිව කරන ලද අපරාධයකි. දැනට බලය දරා සිටින්නන් විසින් එවැන්නක් සැලසුම් කිරීම සහ සූදානම් කිරීම පිලිබඳ වාර්තාව ඇතිතරම් සෑහේ. උදාහරනයක් හැටියට 2001 සැප්තැම්බර් 11 දිනට පෙර මාසවල දී චෙනීගේ එක්සත් ජනපද බලශක්ති සමාගම්වල ඉහල ම විධායක නිලධාරීන් ඇතුලත් වන හොර-රහස් බල ශක්ති කාර්ය සාධක බලකාය ඉරාක තෙල්බිම් දක්වන සිතියම් සමීපව බලාගනිමින් ඒවා ඇමරිකා එක්සත් ජනපදයේ ද යුරෝපයේ ද තෙල් කොම්පැනිවල විවිධ ඉල්ලුම්කරුවන්ට පංගු කර දෙන්නේ කෙසේ දැයි සිතා බැලූහ.

"වැරදි තැන, වැරදි කල්හි කරන ලද වැරදි යුද්ධය" යයි ඉරාක යුද්ධය නම් කර ගෙන යුද්ධයේ විවේචකයෙකු ලෙස පෙනී සිටීමට කෙරී දරන්නා වූ උත්සාහය කුමක් වුවත්, ඩිමොක්‍රැටික් පක්ෂය ඉරාකය බලාත්කාර දූෂනයට ලක් කිරීමේදී අපරාධ සහකරු ලෙස ක්‍රියාකර ඇත. එය යුද්ධයේ විරුද්ධකරුවෙකු ලෙස කවර විටෙකවත් ක්‍රියාකර නැත. බිල් ක්ලින්ටන්ගේ ඩිමොක්‍රැටික් පාලනාධිකාරය බෝම්බ හෙලමින් ද මිනීමරමින් ද බුෂ්ගේ යුද්ධ ප්‍රචාරයට පදනම සැපැයූ මිථ්‍යා කතා වගා කරමින් ද ඉරාක ජනතාව අවුරුදු 8ක් තිස්සේ බඩගින්නේ තැබීමට ක්‍රියා කර තිබේ. ආක්‍රමනය සිදු කරන ලද තැන් පටන් ම බිල් ක්ලින්ටන් හා ඔහුගේ බිරිඳ හිලරි ක්ලින්ටන් ආක්‍රමනයේ දී ඉරාකය අල්ලාගෙන සිටීමේ ද දැඩි ආධාරකරුවන් ලෙස ඉදිරියට අවුත් සිටිති. තමාගේ උපජනාධිපති ධුරාපේක්ෂක සහකරුවා වන ජෝන් එඩ්වර්ඩ්ස් ද සමග එක්ව 2002 ඔක්තෝබරයේ දී, බුෂ් එම යෝජනාව ප්‍රයෝජනයට ගන්නා බව දැන දැන ම කොන්ග්‍රස් මන්ඩල යුද යෝජනාවට පක්ෂව ඡන්දය දුන්නේ ය.

ඩුඑල්ෆර් වාර්තාව ආපසු, යුද්ධයෙන් ඈත් වී ගැනීමට ඩිමොක්‍රැටික් පාක්ෂිකයෝ අලුත් උත්සාහයක් දැරූහ. සෙනේට් මන්ඩල බුද්ධි අංශ කමිටුවේ ප්‍රධාන ඩිමොක්‍රැටික් පාක්ෂිකයා වන IV වන ජෝන් ඩී රොකෆෙලර් මෙම වාර්තාව “විනෂ්ටක” යයි කියා සිටියේ ය.

රොකෆෙලර් ප්‍රකාශයක් කරමින් මෙසේ කී ය. “සදාම් අත සැබැවින් ම අවි තිබුනේ ද, ඔහුට අවි නිෂ්පාදනයට හැකියාවක් තිබුනේ ද, යන්න හැර, එවන් අවි වැඩ පිලිවෙලක් ආරම්භ කිරීමට ඔහුට අධ්‍යාසයක් තිබුනේ ය යන්න පමනක් ම ඉරාකය ආක්‍රමනය කිරීමට සෑහේ ය යි මහජනයා ලවා විශ්වාස කරවා ගැනීමට බුෂ් පරිපාලනය කැමති වනු ඇත.” ඔහු තවදුරටත් මෙසේ ද කී ය. “ඇත්තට ම අපි රට ආක්‍රමනය කලෙමු. දහස් ගනන් ජනයා මරා දමනු ලැබූහ. ඒත් ඉරාකය කිසිදාක බරපතල හෝ වැඩී එන තර්ජනයක් ව තිබුනේ නැත.”

යුද්ධයේ විවේචකයන් ලෙස පෙනී සිටීමට උත්සාහ කරන කල්හි ඩිමොක්‍රැටික් පාක්ෂිකයෝ නො විසඳිය හැකි පරස්පරයන්හි පැටැලෙති. ආක්‍රමනය කිරීමට ගත් තීන්දුව විවේචනය කරන ගමන් ම ඔව්හු යුද්ධය ජයග්‍රහනය දක්වා පවත්වාගෙන යාමට පොරොන්දු ද වෙති. විදේශ ආක්‍රමනයට විරුද්ධ ව සටන් වදින ඉරාක ජාතිකයන් තලා දැමිය යුතු "ත්‍රස්තවාදීන්" සහ "සතුරු බලවේග" ලෙස හංවඩු ගැසීමට ඔහු රිපබ්ලිකානුවන් සමග එක්වෙති.

ඉරාකය තුල ඇමරිකානු පාලක පන්තියට වැඩෙමින් පවතින්නා වූ ව්‍යසනය එම පන්තිය සහ එහි රාජ්‍ය යන්ත්‍රය තුල තියුනු අර්බුදයක් අවුලුවා තිබේ. කෙරීගේ ඡන්ද ව්‍යායාමය හිටිඅඩියේ යුද්ධය කෙරේ වඩාත් විවේචනශීලී ආස්ථානයක් කරා මාරුවීම සිදු වී පවත්නේ එහෙයිනි; බුෂ්ගේ මුසාවන් එකින් එකට වලකපමින් වාර්තා රොත්තක් එකපිට එක ගලා ඒමට - ඒවායින් බොහෝවක් යුද්ධ-බුද්ධි අංශ තන්ත්‍රයේ ඉහල ම මට්ටම්වල අනුග්‍රහය ඇතිව - පිට කරනු ලබන්නේ ද ඒ නිසා ම ය. තදබලව විවේචනාත්මක ඩුඑල්ෆර් වාර්තාව ඇමරිකානු ජනාධිපතිවරනයේ උච්ච අවස්ථාවේ බුෂ් පාලනාධිකාරයට වැඩිම පාඩුව කැටෙන අවස්ථාවක කාලය තීන්දු කර නිකුත් කිරීම ම මෙම ගැටුමේ ගැඹුර ද දෘඪත්වය ද පෙන්නුම් කරයි.

අධිරාජ්‍යවාදීන් අතර මෙම සට්ටනයේ දී ඇමරිකානු කම්කරු පන්තියට මින් කොයි ම පැත්තක් සමග වුව පෙල ගැසිය නො හැකි ය. බුෂ් දිනුවත්, කෙරී දිනුවත්, මීලඟට ධවල මන්දිරය අරක් ගන්නා තැනැත්තා, ඉරාකයේ ද මුලු මැදපෙරදිග ද එක්සත් ජනපද ආධිපත්‍යය පවත්වාගෙන යාමට අප්‍රතිහතව කැප වූ අධිරාජ්‍යවාදයේ සුවච ආරක්ෂකයෙකු වනු ඇත.

ඇමරිකානු වැඩ කරන ජනතාව ඉදිරියේ ඇති කර්තව්‍යය වන්නේ, අධිරාජ්‍යවාදී යුද්ධයට ද ඒ හා නො ලිහියහැකිව සිය අවශ්‍යතා බැඳී ඇති මහ සංගත ලොක්කන්ගෙන් සහ බහුමිලියනපතියන්ගෙන් සමන්විත එක්සත් ජනපද පාලක ප්‍රභූවට ද ප්‍රතිවිරුද්ධ වූ ස්වාධීන මහාජන ව්‍යාපාරයක් ගොඩනගා ගැනීම ය. 2004 ඡන්ද විමසීම් ව්‍යායාමය තුල ද අනිවාර්යයෙන් ම ඉක්බිතිව එනු ඇති මහා දේශපාලන අරගලයන් තුල ද සමාජවාදී සමානතා පක්ෂය සටන් වැද සිටින්නා වූ ඉදිරිදර්ශනය නම් මෙය යි.

© www.wsws.org